19 වන පිටෙන්

ජනතාවගෙන් පමණක් නොව රටේ සමස්ථ ජනතාවගෙන්ම අදහස් විමසීමක් කළ යුතුය. මන්ද, මේ රටේ දෙමළ ජනගහනයෙන් 60%ක් පමණ ජීවත්වන්නේ උතුරු-නැගෙනහිර නොව පිට පළාත්වල බැවිනි. කොළඹ ආශ්‍රිතව සහ වතුකරයේ විශාල පිරිසක් සිටිති. වතුකරයේ ජනතාවට යාපනයේ පදිංචි විය නොහැකිය. නමුත් යාපනයේ ජනතාවට කොළඹ හෝ වතුකරයේ පදිංචි විය හැකිය. පළාත් ඒකාබද්ධ කරන්නේ නම් මේ පිට පළාත්වල සිටින දෙමළ ජනතාව ඒ සම්බන්ධයෙන් දරන අදහස විමසීමද අවශ්‍යය ය. එසේ නොමැතිව පුද්ගලයෙකු දෙදෙනෙකු සතුටු කිරීමට හෝ කිසියම් මතවාදයක් තුළ එල්බගෙන සිටීම නිසා හෝ පළාත් ඒකාබද්ධ කිරීම තවත් කුඩා

**78 ව්‍යවස්ථාවෙන් හදුන්වා දුන් විධායක ජනාධිපති ක්‍රමය යටතේ බලයට පත්වුණු ජනාධිපතිවරුන් පස් දෙනා සැළකිල්ලට ගැනීමේදී ඔවුහු එකම ව්‍යවස්ථාව යටතේ විවිධ ආකාරයෙන් හැසිරුණු බව ප්‍රකටය.**

කුඩා ජන කොට්ඨාශවලට කරන විශාල අගතියකි. ඒ අය එක ජාතියකින් මිදී තවත් ජාතියක සපත්තු අඩියට යටත් කිරීමක් සිදු වෙන බැවිනි.

උතුරු පළාතේ ඉල්ලීම වන්නේ ආණ්ඩුකාරයා අයින් කරන ලෙසය. දකුණේ බහුතරය කියන්නේ ආණ්ඩුකාරයා ශක්තිමත් කළ යුතු බවය. මෙතැන ඇත්තේ විශ්වාසය පිළිබඳ ප්‍රශ්නයකි. දෙපාර්ශ්වයේම සැකයට හේතුවන ආකාරයේ කාරණා බොහොමයක් මෙහෙයුම් කමිටු වාර්තාවේ තිබේ. 'ඒකීය', 'ඔරුමිත්තනාඩු' යන වචන පවා මේ වන විට ප්‍රශ්නගත කාරණා බවට පත්ව ඇත. නව ව්‍යවස්ථාව සම්පාදනයේදී එහි ඇතුළත් වචන යෙදීම පවා මිනිසුන් සතුටු කරන ආකාරයෙන් කළ යුතුව තිබේ. කුමන වචන යෙදුවද බලය බෙදීම බහුවිධ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වන ආකාරයෙන් සිදුවිය යුතුය.

භාෂාව පදනම් කරගෙන පමණක් බලය බෙදීම සිදු නොකළ යුතුය. භාෂාව ජනවර්ගයක් වෙන්කොට ගැනීමේ එකම ශාදකය නොවන බැවිනි. ජන වර්ගයක් වෙන්කොට ගැනීම භාෂාවට එහා යන ගිය ශාදක මත රදා පවතී. එකම භාෂාවක් කතා කිරීම හේතුවෙන් බලය අවශ්‍යයයි කීම තාර්කික නොවේ. ඇතැම් පළාත්වල මුස්ලිම් ජනතාව දෙමළ භාෂාව කතා කරන්නේ ඒ පළාත්වල පවතින සංස්කෘතික විවිධත්වය හේතුවෙනි. ඔවුන්ගේ නියම භාෂාව දෙමළ භාෂාව නොවේ. භාෂාව බලය බෙදීමේ පදනම වශයෙන් ගතහොත් මතු කවදා හෝ ඔවුහු ඒ කරුණ මුල් කොට ගෙනම අරගලයකට පිවිසිය හැකිය. එවැනි තත්ත්වයක් නැගෙනහිර පළාතේ දැනටත් දක්නට ලැබේ. පාලකයෝ එය ඉතා මැනවින් තේරුම්ගෙන ඉතාම උපායශීලි ලෙස කටයුතු කළ යුතුව තිබේ.

## විධායක ජනාධිපති ධුරය

78 ව්‍යවස්ථාවෙන් හදුන්වා දුන් විධායක ජනාධිපති ක්‍රමය යටතේ බලයට පත්වුණු ජනාධිපතිවරුන් පස් දෙනා සැළකිල්ලට ගැනීමේදී ඔවුහු එකම ව්‍යවස්ථාව යටතේ විවිධ ආකාරයෙන් හැසිරුණු බව ප්‍රකටය. විධායක ජනාධිපති ධුරය ලෙස ජනතාව හදුනාගෙන සිටින්නේ ඒ ඒ හැසිරීම් සහ ඒවායේ ප්‍රතිඵලය. ඒ හැසිරීමට අවශ්‍ය පසුබිම සකසන්නේ ව්‍යවස්ථාවේ තිබෙන ප්‍රතිපාදනයන්ය. 78 ව්‍යවස්ථාවෙන් ආර්ථිකය හැසිරවීමට ගෙනා විධායක ජනාධිපති ධුරය පිළිබඳ අද සළකා බැලිය යුතු වන්නේ වෙනස් ආකාරයකටය. විධායක ජනාධිපති ධුරය පාවිච්චි කොට වර්තමාන සමාජ තත්ත්වය අනුව බහුවිධ සංස්කෘතියක් සහිත ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නේ කෙසේද යන්න අද සළකා බැලීමට සිදුව තිබේ. මෙහිදී අතීතයේ ලද නරක අත්දැකීම්වලට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ප්‍රතිකර්ම සොයාගන්නට සිදුවේ.

- මේ තනතුර තවදුරටත් පැවතිය යුතුද?
- එසේ නම් එය කවර ප්‍රතිසංස්කරණයන්ට යටත් විය යුතුද?
- එය නැති කර පාර්ලිමේන්තුව තුළ වෙනත් විධායකයක් නිර්මාණය කළ යුතුද?

යන කාරණා ගැඹුරින් සළකා බැලිය යුතුය.

වත්මන් ව්‍යවස්ථාවේ විධායක ජනාධිපතිවරයා කිසිවකට වගකියන තනතුරක් නොවේ. සංවරණය සහ තුලනය මූල ධර්මය තුළ ව්‍යවස්ථාව සකස් කළේ නම් එය එසේ වන්නේ නැත. හැම දෙනාම වගකිව යුතු පුද්ගලයෝ බවට පත්වෙති. ඇමරිකාවේ ජනාධිපතිවරයාට පවා හිතුමතයේ වැඩ කළ නොහැකිය. සංවරණය සහ තුලනය මූල ධර්මයෙන් ජනාධිපතිගේ බලය හිර කොට තිබේ. ඒවා පදනම් කරගනිමින් මේ තනතුර සැකසිය යුතුව තිබේ.

විධායක ජනාධිපති තනතුරේ හොඳ ලක්ෂණද නැත්තේ නොවේ. අපි මෙය නරක බව කියන්නේ අපේ අත්දැකීම් අනුවය. අපේ අත්දැකීම් වන්නේ ඒ ඒ පුද්ගලයෝ විධායක ජනාධිපති ධුරය තුළ ක්‍රියාත්මක වුණු ආකාරයයි. එයට හේතුව ව්‍යවස්ථාව නම් ඒ කරුණු වෙනස් කළ යුතුය.

තවදුරටත් මේ තනතුර තිබීමේ වැදගත්කමක්ද මම දකිමි. මෙය රටේ සුළු ජනවර්ගද ඇතුළත්ව සියලු දෙනාගේ චන්දයෙන් තෝරාගන්නා තනතුරකි. එහිදී රට එකම ඡන්ද කොට්ඨාශයක් ලෙසින් සලකා තෝරාගැනීම සිදු කෙරේ. එවිට එක් අතෙකින් විධායක ජනාධිපති ධුරය සංහිඳියාවේ සංකේතයක් බවට පත්වේ. අද වැදගත් මේ සංහිඳියාවය. සංහිඳියාවට පාලකයන්ගේ හැසිරීම් රටාව විශාල බලපෑමක් කරයි. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතුමය කියා සමහර දේශපාලන පක්ෂ දැඩි මතයක සිටින්නේ ඒ අය ලබා ඇති බරපතල අත්දැකීම් නිසයි. නමුත් එහෙම වුණෝ ව්‍යවස්ථාවේ තියන දේවල් සමඟය. ඒවා පාලනය කොට, සියලු ජනවර්ගයන්ගේ විශ්වාසය දිනාගත හැකි ආයතනයක්, සුබවාදී සම්බන්ධකයක් ලෙස විධායක ජනාධිපති ධුරය පවතී නම් එය හොඳ බව මගේ අදහසයි.

## ෆෙඩරල් භීතිකාව

මේ පිළිබඳ පුළුල් කතිකාවතක් සිදුවුවද කවදා හෝ ප්‍රාන්ත වෙන්වී වෙනම රාජ්‍යයන් බිහිවනු ඇති බවට ඇතැම් පර්ශ්ව සැක උපදවති. එවැනි සැක පහ කිරීම සඳහා ඉන්දියාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පරිදි යම් ප්‍රාන්තයක් සීමාව ඉක්මවා කටයුතු කරන්නේනම් එවැනි අවස්ථාවකදී එයට මැදිහත්වීමට ජනාධිපතිවරයාට බලතල දිය යුතුය. ඒ සඳහා නීතිමය ප්‍රතිපාදන ඇති කළ යුතුය. එවිට ජනතා විශ්වාසය දිනාගත හැකිය. කෙසේ වුවද වඩාත් වැදගත් වන්නේ පරිධියට බලය බෙදා හැරීමය. අයිතිවාසිකම් ආරක්ෂා වන්නේ එසේ බලය දුන් විටය. වඩාත් නැවුම් ආකාරයකට රටේ දේශපාලන වෙනසක් සිදුකර ගැනීමට නම් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්, අලුත් පාර්ලිමේන්තුවක්, අලුත් ජනාධිපති ධුරයක් එකවිට ක්‍රියාත්මක විය යුතු යැයි මම සිතමි.

තිසර

තිසර
වසර පහක ගමනක්

ගුවන් විදුලි තරංග ඔස්සේ පමණක් හඬ සන්නිවේදනය කෙරුණ යුගයේ එහි ගමන් පරාසය සීමිත විය. තාක්ෂණයේ දියුනුවත් සමගම ගුවන් විදුලි තරංග වලින් බැහැරව අන්තර්ජාලය ඔස්සේ හඬ විසුරුවන්නට හැකි වීමත් සමගම ගුවන්විදුලි සේවා සිය සේවා පරාසය ප්‍රාන්ත දෙශසීමා අභිබවා ජාත්‍යන්තරය දක්වා වැඩි කරගන්නට සමත්විය. තිසර බිහිවන්නේ ගුවන්විදුලිය අන්තර්ජාතික තලයට ගෙන යන්නට ලැබුණ මේ අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් ය.

2012 වසරේ ජූනි 15 වන දින අන්තර්ජාලයට එක් කෙරුණ තිසර මේ වන විට වසර පහකට වැඩි කාලයක් නොකඩවා අසන්නන් වෙත ගමන් කර ඇත. වසර පහක් වසරේ දින තුන්සිය හැට පහක් තුළ පැය විසිහතරකම ක්‍රියාත්මක වන තිසර අද වන විට ලොව පුරා රටවල් සිය ගණනක අසන්නනන් වෙත සමීපවී ඇත්තේ ය. සුභාවිත ගීතයට බර තබමින් විකාශය වන තිසර ට ඇහුම්කන් දෙන අසන්නන් අතර සුවිශේෂී අනන්‍යාතාවක් රැක ගන්නට තිසර සමත්වී ඇත.

අන්තර්ජාලය ඔස්සේ www.thisara.com වෙබ් අඩවියෙන්ද ස්මාට් ෆෝනයෙන් ThuneIn හෝ Sri lankaRadio ඇප්ස් හරහා ද ලෝකයේ ඕනෑම තැනක සිට සවන්දිය හැකි තිසර අන්තර්ජාල ගුවන්විදුලි යන්ත්‍ර හරහාද ඔබට සමීප වෙයි.

## විනී හෙට්ටිගොඩ

